# හාරිස්පත්තුව අත්තරගම රජමහා විහාරයේ පවතින ශිලා කැටයම් පිළිබඳ විමර්ශනයක්

**ජයසිංහ ජේ.එල්.ජී.වී.එම්.එස්.එස්.**[1]

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව මැදසියපත්තුවේ අත්තරගම ග්‍රාමසේවා වසමේ පිහිටි අත්තරගම රජමහ විහාරය පෞරාණිකත්වය පිළිඹිබු වන පුරාවිද්‍යාත්මක අගයෙන් යුත් විහාරස්ථානයක් වන අතර විහාර භූමියේ විසිරි පවතින ශිලා කැටයම් පිළිබඳව විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මූලික වශයෙන් දත්ත එක්රැස් කරගැනිමේදී පූර්ව පර්යේෂණ සඳහා අවධානය යොමුකරමින් පුස්තකාල අධ්‍යයන සිදුකළ අතර පසුව ක්ෂේත්‍රය ගවේෂණය කරමින් නිරීක්ෂණය කිරීම හා සම්මුඛ සාකච්ඡා සිදුකරන ලදී. විහාර භූමියේ පවතින ශිලා කැටයම් මෙහි ස්ථාපිත වීමට හේතු වශයෙන් ප්‍රදේශය පුරා ප්‍රචලිතව පවතින ජනප්‍රවාදයන් රැසකි. මෙම ශිලා කැටයම් පිළිබඳව අධ්‍යයනය කිරීමේදී සමස්ත කැටයම් පුවරුවල හැඩය, වස්තු විෂය, කැටයම්වල නිරූපිත වස්තූන් හා හැඩතල පිළිබඳව අවධානය යොමු කරන ලදී. දිගු සතරැස් හැඩ, ඕවලාකාර හැඩ, අර්ධ වෘත්තාකාර හැඩ, වෘත්තාකාර හැඩ හා අක්‍රමවත් හැඩ සහිත ශිලා කැටයම් පුවරු මෙහි වන අතර මල් වර්ග, ලියවැල් රටා, විවිධ සත්ව රූප, මනඃකල්පිත සත්ව රූප, ජ්‍යාමිතික හැඩතල හා සාම්ප්‍රදායික මෝස්තර එම කැටයම් පුවරු සඳහා යොදාගෙන ඇත. නෙළුම් මල හා වෙනත් මල් වර්ග මෙම ශිලා කැටයම් පුවරුවල බහුලව දක්නට ලැබෙන අතර ලියවැල්, පලාපෙති මෙන්ම විවිධ ශාක පත්‍ර ද කැටයම්කරණය කර ඇත. අර්ධ වෘත්තාකාර සඳකඩපහන්වල හා කැටයම් පුවරුවල එකපෙළට දිවයන හා දෙපසට දිවයන හංස, ඇත් හා සිංහ රූප වන අතර මුහුණින් මුහුණ බලා සිටින ඇත්, සුනඛ හෝ හිවල් රූප, සිංහ හා මොනර රූප මෙන්ම වානර රූපයක් ද මෙහි කැටයම් තුළ වේ.  මහනුවර යුගයේ නිර්මිත සඳකඩපහණ බොහෝවිට ත්‍රිකෝණාකාර හැඩයක් ගන්නා අතර එහි දෙපස පිරිහුණු වකරටා වැනි රූකම් දක්නට ලැබේ. මෙම විහාරයේ පවතින කැටයම් පුවරු අතර ද එම හැඩයන් දක්නට ලැබේ. ඒ අනුව මෙම අත්තරගම රජමහ විහාරයේ පවතින ශිලා කැටයම් අතර උසස් නිර්මාණ ලක්ෂණ ප්‍රකට කරවන කැටයම් පුවරු කිහිපයක් පවතින අතර බොහෝ නිර්මාණයන් අවසන් නොකළ බවක් දක්නට ලැබේ. අදවන විට බොහෝ නිර්මාණයන් විනාශ වී ඇති අතරම මෙම විහාරය සතුවන ශිලා කැටයම් පිළිබඳ තොරතුරු අල්ප වන බැවින් පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති මෙම උරුමයන් ආරක්ෂා කිරීම ඉතා වැදගත් වන්නේය.

**ප්‍රමුඛ පද :** අත්තරගම, මහනුවර යුගය, ශිලා කැටයම්, සඳකඩපහණ, නෙළුම් මල

[1]පුරාවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, vishwasrijayasinghe@gmail.com